# ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

## ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් සඳහා වූ හැඳුනුම්පත
## - උපදෙස් පත්‍රිකාව -

1. පැහැදිලි හා කියවිය හැකි අත් අකුරින් ලියන්න.

2. 35 මි.මී. පළල x 45 මි. මී උස ප්‍රමාණයේ වර්ණ (සුදු පසුබිම) ඡායාරූප 02 ක් එවිය යුතු ය. එක් ඡායා රූපයක් අයදුම් පත්‍රයේ අලවා එවිය යුතු අතර එහි පරිලෝකනය (Scan) කරන ලද පිටපතක් invent.id.slic@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට ඊමේල් කළ යුතුය. ඊමේල් කිරීමේදී පැහැදිලිව ඔබේ නම සඳහන් කර එවිය යුතුය. (ඡායා රූපය මත කිසිවක් නොලිවිය යුතු අතර එය විකෘති නොකළ යුතු ය)

3. කොටු පිරවීමේදී පහත උපදෙස් පිළිපැදිය යුතු ය.
   1. සපයා ඇති උපදෙස් පත්‍රිකාවේ සඳහන් තොරතුරු වලට අනුව ඉල්ලුම්කරන ක්ෂේත්‍රය සලකුණු කළ යුතු ය.
   2. **අංක 01** සිංහල හෝ දෙමළ අකුරෙන් පිරවිය යුතු අතර **අංක 02** ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතු ය.
   3. සෑම සම්පූර්ණ වචනයකටම පසුව එක් කොටුවක් හිස්ව තබන්න.
   4. උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි සම්පූර්ණ නම සටහන් කරන්න.

4. සෑම ඉල්ලුම්කරුවෙක්ම පහත සඳහන් කර ඇති ක්ෂේත්‍ර 01ක් හෝ කිහිපයක් යටතේ ඉල්ලුම් කළ යුතු ය.
   1. **අංශය I -** ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මගින් නිකුත් කරන ලද පේටන්ට් බලපත්‍රය හිමි සියළු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට ජීවිත කාලය පුරාවට බල පවතින පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීමට අයිතිය හිමි වේ.

   2. **අංශය II -** වෙනත් රටකින් නිකුත් කර ඇති පේටන්ට් බලපත්‍ර හිමි ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට සිය ජීවිත කාලය පුරාවට බල පවතින පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීමට අයිතිය හිමි වේ.

   3. **අංශය III -** ජාත්‍යන්තරව පිළිගත් පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) යටතේ ආවරණයක් ලබා ඇති සියලු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් හට, එම ආවරණය වලංගු වන කාල සීමාව තුල බල පැවැත්වෙන පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා අයිතිය හිමි වේ.

   4. **අංශය IV -** පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කර ඇති සියලු ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට ඒ සඳහා ලියාපදිංචි වූ දින සිට වසර 2ක කාලසීමාවක් දක්වා වලංගු වන පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීමට අයිතිය හිමි වේ. පේටන්ට් බලපත්‍රය නිකුත් කිරීම මෙ අතර කාලයේ දී සම්පූර්ණ නොවිණි නම් අදාල නිකුත් කිරීම දක්වා එක් වසර බැගින් කාලය දීර්ඝ කල හැකි ය.

   5. **අංශය V -** ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සංවිධානය කරන "සහසක් නිමැවුම්" ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය හා තරඟය සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණ (පළමු/ දෙවන හෝ තෙවන ස්ථාන) ලැබූ නමුත් පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට නොහැකිවූ ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට ජයග්‍රහණය ලැබූ දින සිට වසර 02ක කාල සීමාවක් දක්වා වලංගු වන පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීමට අයිතිය හිමි වේ. එම නිපැයුම්කරු ඒ හා සමාන ජයග්‍රහණයක් එම වසර 02 තුලදී වෙනත් නව නිපැයුමක් සඳහා නැවත ලබාගත හොත් එම ජයග්‍රහණය ලැබූ දින සිට වසර 02ක කාල සීමාව දක්වා එම හැඳුනුම්පතේ වලංගුභාවය දීර්ඝ කෙරේ.

5. පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් ඉල්ලුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතු ය. මෙම ඡායා පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය
iii. ලබාගත් පේටන්ට් බලපත්‍ර වල සහතික
iv. ඉල්ලුම්කර ඇති පේටන්ට් බලපත්‍ර වල ලදුපත්
v. ලබාගත් ජයග්‍රහණ වල සහතික පත්‍ර (දේශීය/විදේශීය)

6. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්, "කොමසාරිස්, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, අංක 46 – 48, කොටා පාර, කොළඹ 08" යන ලිපිනයට යොමු කල යුතුය.

7. උපදෙස් වලට අනුකූල නොවන අයදුම්පත්‍ර කොමිසම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.